# XXII පරිච්ඡේදය

## දේපල නැති වීම (අස්ථානගත වීම)

1. පොදු

2. දේපල වලට හානිවීම සහ නැතිවීම සම්බන්ධයෙන් ගනු ලබන ක්‍රියාමාර්ග

3. මණ්ඩපයන්හි සහ විද්‍යායතනයන්හි සිදුවන දේපල නැතිවීම

4. විශ්වවිද්‍යාල දේපලවලට ශිෂ්‍යයන් විසින් සිදුකරන හානි

## XXII පරිච්ඡේදය

## දේපල නැති වීම (අස්ථානගතවීම)

### 1. පොදු

1.1 “නැති වීම” යන්නෙන් අදහස් වන්නේ කොමිෂන් සභාවට/උසස් අධ්‍යාපන ආයතනයකට/විද්‍යායතනයකට අයත් ව තිබෙන හෝ තම ආයතනයට අයත් නොවූවද එම භාරයේ ඇති යම් දේපලක් නැති වීම (අස්ථානගත වීම) හෝ එම දේපලට හානි වීමයි. මෙම තත්වයට හානි සිදු වීමෙන්, හැකිළීමෙන්, එසේ ත් නොමැති නම් දිරාපත් වීම නිසා සිදුවන හානි වීම් ඇතුලත් වන නමුත්, එළිමහනේ තබා ඇති හෝ සවිකර ඇති දේපල ස්වභාවික ආපදාවක් නිසා නැතිවීම ඇතුලත් වන්නේ නැත.

“නැතිවීම” නිර්වචනය කිරීම

1.2 කොමිෂන් සභාව විසින් හෝ උසස් අධ්‍යාපන ආයතනයක් /විද්‍යායතනයක් විසින් එකී ආයතනයන් හි සේවයේ නියුතු යම් තැනැත්තෙකු වෙත, ස්ථිරවම හෝ තාවකාලිකව එම තැනැත්තා භාරයට පත්කොට ඇති කොමිෂන් සභාවට/ උසස් අධ්‍යාපන ආයතනයකට/විද්‍යායතනයකට අයත් හෝ එකී ආයතන භාරයේ තබා තිබෙන යම් දේපලක් ආරක්ෂා කිරීම සම්බන්ධයෙන් ද, මනා පරිහරණය සහ නිසි බැහැර කිරීම් සම්බන්ධයෙන් ද, කොමිෂන් සභාවේ/උසස් අධ්‍යාපන ආයතනයේ/විද්‍යායතනයේ සේවයේ නියුතු එම තැනැත්තා විසින් සෑම කල්හි ම පෞද්ගලිකව වගකීම දැරිය යුතු වේ.

පෞද්ගලිකව වගකීම

1.2.1 එබඳු දේපලක් නැති වුවහොත් හෝ එම දේපලට හානියක් සිදු වුවහොත් හෝ ඒ සම්බන්ධයෙන් ගණනය කරන අවස්ථාවක දී එය ගණන් ගැනීමට ඉදිරිපත් කළ නොහැකි වුවහොත්, එපරිද්දෙන් නැති වූ, හානි වූ හෝ ගණනයට ඉදිරිපත් කළ නො හැකි වූ දේපලවල වටිනාකම කොමිෂන් සභාවේ ගණකාධිකාරීවරයා විසින් හෝ උසස් අධ්‍යාපන ආයතනයක මූල්‍යාධිකාරීවරයා/ භාණ්ඩාගාරිකවරයා විසින් හෝ විද්‍යායතනයක /උසස් අධ්‍යාපන මධ්‍යස්ථානයක වඩාත් ජ්‍යෝෂ්ඨතම ගිණුම් නිලධාරියා විසින් හෝ නිගමනය කොට, ඒ සඳහා වගකිවයුතු තැනැත්තාගෙන් අයකර ගත හැකි ය.

අයකර ගැනීමට යටත් වේ

1.2.2 යම් දේපලක් නැති වීම හෝ හානි වීම සිදුවූයේ යම් තැනැත්තෙකුගේ නො සැළකිල්ල, අනවධානය, අතපසුවීම හෝ වංචාකාරී ක්‍රියාවක් සහ/හෝ අදාළ දේපල සුරක්ෂිතව

විනය ක්‍රියාමාර්ග ගැනීම

තබා ගැනීම පිණිස ලබාදුන් උපදෙස් නිසි පරිදි පිළිපැදීමට අපොහොසත්වීම හේතුවෙන් නම් ඉහත 1.2.1. උපජේදයෙහි සඳහන් ක්‍රියාමාර්ගයට වැඩිමනක් වශයෙන්, එසේ වගකිව යුතු තැනැත්තා හට විරුද්ධව විනය ක්‍රියාමාර්ගයක් ගැනීම ද කළ යුතු ය.

1.2.3 භාණ්ඩ භාර ගැනීම, භාරයේ තබා ගැනීම, නිකුත්කිරීම සහ බැහැරකිරීම සම්බන්ධයෙන් ස්ථිරවම හෝ තාවකාලිකව වගකීම පවරන ලද ගබඩාභාරකරුවන් සහ වෙනත් එවැනි තැනැත්තන් විසින් තම භාරයේ තිබෙන සම්පූර්ණ භාණ්ඩ ප්‍රමාණය සම්බන්ධයෙන් ඕනෑම අවස්ථාවක දී ගණන් හිලව් දැක්වීමට හැකි විය යුතු ය. මෙම අවශ්‍යතාවය සපුරාලීමට අපොහොසත් වන තැනැත්තන් ඉහත 1.2.1 උපජේදයෙ හි සඳහන් පරිදි අදාල භාණ්ඩවල වටිනාකම වහා ගෙවිය යුතු අතර, ඉහත 1.2.2 උපජේදයෙ හි සඳහන් පරිදි, විනය ක්‍රියාමාර්ගයන් සඳහා මුහුණ දීමට ද සිදු විය හැකි ය.

ගබඩාභාරකරුවන්ගේ වගකීම

## 2. දේපල වලට හානිවීම සහ නැතිවීම සම්බන්ධයෙන් ගනු ලබන ක්‍රියාමාර්ග

2.1 දේපල භාරව සිටින හෝ එම දේපල භාරය පිළිබඳ වගකීම දරන සියලුම නිලධාරීන් එකී කුමන හෝ දේපලක් නැති වී තිබෙන බව දැනගත් වහාම ඒ බව, කොමිෂන් සභාවේ/ උසස් අධ්‍යාපන ආයතනයක / විද්‍යායතනයක දේපල භාරකාරීත්වය දරන නිලධාරියා හට වහාම වාර්තා කළ යුතු ය. එමෙන් ම, එම කරුණ අදාළ පරිදි, කොමිෂන් සභාවේ සභාපතිවරයාට, උසස් අධ්‍යාපන ආයතනයක/ විද්‍යායතනයක ප්‍රධාන විධායක නිලධාරියාට ද වාර්තා කළ යුතු ය. කොමිෂන් සභාව විසින් වරින් වර නිගමනය කරනු ලබන තක්සේරු වටිනාකමට වඩා ඉහල අගයකින් යුතු භාණ්ඩයකට සිදු වූ නැතිවීමක් හෝ හානියක් අදාල පරිදි කොමිෂන් සභාවට හෝ උසස් අධ්‍යාපන ආයතනයක/ විද්‍යායතනයක පාලක බල මණ්ඩලයට ද වාර්තා කළ යුතු ය.

නැති වීම් සහ හානි වීම් වාර්තා කිරීමේ වගකීම

2.2 යම් දේපලක් නැති වූ බවට හෝ දේපලක් හානි වී ඇති බවට වාර්තා වූ විට, කොමිෂන් සභාවේ/ උසස් අධ්‍යාපන ආයතනයක/ විද්‍යායතනයක දේපල භාරකාරීත්වය දරන නිලධරයා විසින් පනත සඳහන් ක්‍රියාමාර්ග අනුගමනය කළ යුතු වේ.

නැති වීම හෝ හානි වීම සම්බන්ධයෙන් පිළිපැදිය යුතු ක්‍රමවේදය

(අ) නැති වූ හෝ හානි වූ දේපලවලට අදාල වූ පොත්පත් හා වාර්තා ආරක්ෂිතව තැබීමට නිසි ආරක්ෂක වැඩ පිළිවෙළක් යෙදිය යුතු ය.

ප්‍රමාණවත් ආරක්ෂක වැඩපිළිවෙලක්

(ආ) නැති වූ හෝ හානි වූ දේපලවල ප්‍රමාණය සහ එසේ සිදුවීමට හේතු සොයා ගැනීම සඳහා මෙන් ම, එම නැති වීමට හෝ හානි වීමට වගකිව යුතු තැනැත්තන් සොයා ගැනීම සඳහා සුදුසු පරීක්ෂණයක් පැවැත්වීම. මෙම පරීක්ෂණය ආචාර්ය මණ්ඩල සාමාජිකයකු විසින් හෝ වෙනත් සුදුසු නිලධාරියකු විසින් අභ්‍යන්තර පරීක්ෂණයක් ලෙස පැවැත්විය යුතු ය. මෙම පරීක්ෂණය, සම්පූර්ණ වාර්තාවට අවශ්‍ය වන සියලුම තොරතුරු හෙළිකර ගැනීමට අවශ්‍ය පරිදි සිදු කළ යුතු වේ. [ පහත (ඊ) බලන්න]

නැතිවීම හෝ හානිය ගැන තක්සේරු කිරීමට පරීක්ෂණයන් පැවැත්වීම

(ඇ) නැති වීම හෝ හානි වීම සම්බන්ධයෙන් සම්පූර්ණ වාර්තාවක් සකස් කිරීමට දින හතකට (07) අධික කාලයක් ගතවන්නේ යැයි අනුමාන කරන විට, අදාල සිද්ධිය සම්බන්ධයෙන් මූලික පරීක්ෂණ වාර්තාවක් අදාල පරිදි කොමිෂන් සභාවේ සභාපතිවරයාට/උසස් අධ්‍යාපන ආයතනයේ ප්‍රධාන විධායක නිලධාරියාට ඉදිරිපත් කළ යුතු ය; [පහත (ඊ) බලන්න]

මූලික පරීක්ෂණ වාර්තාව

(ඈ) කොමිෂන් සභාව විසින් නිගමනය කරනු ලබන මුදලකට වැඩි වටිනාකමකින් යුතු භාණ්ඩයක් නැති වීම හෝ හානි වීමට භාජනය වී ඇති විට, අදාල පරිදි කොමිෂන් සභාවේ සභාපතිවරයාට/ උසස් අධ්‍යාපන ආයතනයක ප්‍රධාන විධායක නිලධාරියා විසින් විමර්ශන නිලධරයෙකු හෝ පරීක්ෂණ මණ්ඩලයක් පත්කරන තෙක්, වහාම මූලික පරීක්ෂණයක් ආරම්භ කළ යුතු වේ. පත්කරනු ලබන පරීක්ෂණ මණ්ඩලයේ සභාපතිවරයා, ජ්‍යෙෂ්ඨ තනතුරක් දරන නිලධරයෙකු හෝ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය II ශ්‍රේණිය තනතුරකට වඩා කණිෂ්ඨ තනතුරක් නොවන ආචාර්යවරයෙකු විය යුතු ය.

මූලික පරීක්ෂණය

(ඉ) යම් ආකාරයක නැති වීමක්/ හානි වීමක් එනම්; සොරකමක්,වංචාවක්, හදිසි අනතුරක් වශයෙන්, වාර්තා වූ විට, එය වහාම ළඟම ඇති පොලිස් ස්ථානයට පැමිණිලි කළ යුතු ය.

පොලීසියට පැමිණිලි කිරීම

(ඊ) ඉහත සඳහන් (ආ) යටතේ සිදුකල පරීක්ෂණ වාර්තාවන් ලැබුණු වහාම සහ කුමන තත්ත්වයක් යටතේ වුව ද, අදාල නැති වීම, හානිය සිදු වී මාස තුනක් (03) ඉක්ම යාමට මත්තෙන්, පහත සඳහන් කරුණු ද ඇතුලත් වන පරිදි, කොමිෂන් සභාවේ සභාපතිවරයාට/උසස් අධ්‍යාපන ආයතනයක/ විද්‍යායතනයක ප්‍රධාන විධායක නිලධාරියාට සහ විගණකාධිපතිවරයාට ද වාර්තාවන් ඉදිරිපත් කළ යුතු වේ;

සම්පූර්ණ වාර්තාව මාස (03)ක් ඇතුළත

i. භාණ්ඩ ප්‍රමාණය හෝ එක් එක් වර්ගයන් හි ප්‍රමාණය

ii. අයකර ගත හැකි උපරිම වටිනාකම;
නැති වූ භාණ්ඩය වෙනුවට අලුත් භාණ්ඩයක් ලබා ගැනීම තුලින් වැය කිරීමට සිදුවන මුදල වර්තමාන ගණනය කිරීම්වලට අනුව ගත්, රේගු බදු සහ පිරිවැටුම් බදු ආදිය මෙන් ම අලුත් භාණ්ඩයේ වටිනාකමින් 25% මුදලක් ද දෙපාර්තමේන්තු අය කිරීම් වශයෙන්

iii. නැති වීම හෝ හානි වීමට බලපෑ හේතු

iv. නැති වීම හෝ හානි වීමට සෘජුවම හෝ වක්‍රාකාරයෙන් වගකිවයුතු තැනැත්තා හෝ තැනැත්තන්ගේ නම් සහ තනතුරු නාමයන්

v. යම් වංචාවක්, නො සැලකිලිමත්කමක්, ප්‍රමාද දෝෂයක්,මගහැරීමක් හෝ වෙනත් වරදක් සිදුවී ඇත්ද යන වග

vi. පාඩුවට අදාල අයකරගැනීම් සිදුකල යුතු ආකාරය ගැන දැක්වෙන නිර්දේශය

vii. යම් විනයානුකූල ක්‍රියාමාර්ගයක් ගැනීමට යෝජනා කරන්නේ ද යන වග

viii. අදාල නැතිවීම උසාවියක විභාගවන නඩුවකට විෂය වීද? එසේ නම් එම නඩුවේ තීන්දුව කුමක් ද?

ix. නැතිවූ භාණ්ඩ රක්ෂණය කොට තිබුනේ ද යන්න සහ එසේ රක්ෂණය කර තිබුනා නම් කුමන වටිනාකමකට ද?

x. අනාගතයේ දී මෙවැනි සිදුවීම් වැලැක්වීමට දැනටමත් ගෙන ඇති හෝ ගැනීමට බලාපොරොත්තු වන ක්‍රියාමාර්ගයන්

xi. "කපාහැරීමක්" (Write off) කළ යුතු නම්, එය පිළිගත් ක්‍රමවේදයන්ට අනුව සිදුකල යුතු ආකාරය දැක්වෙන නිර්දේශ — "කපාහැරීමක්" (Write off)

2.3 පහත සඳහන් පරිදි නො සැලකිලිමත්භාවයක්, වංචාවක් හෝ වෙනත් වරදක් නොවන අවස්ථාවක දී, යම් නැති වීමක් හෝ හානි වීමක් වාර්තා කළ යුතු නොවේ. — නැති වීම් වාර්තා නො කළ යුතු අවස්ථා

i. "කපා හැරීමක්" අවශ්‍ය නොවන, රු. 500/- කට අඩු වටිනාකමකින් යුත් පරිභෝජනීය භාණ්ඩ,

ii. සම්පූර්ණ වටිනාකම අයකරගත් රු. 500/- ට වඩා අඩු වටිනාකමකින් යුතු භාණ්ඩ

2.4 කොමිෂන් සභාවේ සභාපතිවරයාගේ/උසස් අධ්‍යාපන ආයතනයක/ විද්‍යායතනයක ප්‍රධාන විධායක නිලධාරියාගේ තීරණය ලැබුනු පසු පහත සඳහන් පරිදි ක්‍රියාකල යුතු ය. — අදාල බලධාරීන්ගේ තීරණය ලැබුණු පසු

(අ) පරීක්ෂණයක දී නො සැලකිල්ල, වංචාව හෝ වෙනත් වරදක් අනාවරණය වූ විටක, විනය ක්‍රියාමාර්ග ආරම්භ කළ යුතු ය. — විනය ක්‍රියාමාර්ග
(නැති වීම හෝ හානිය සම්බන්ධයෙන් යම් තැනැත්තෙකුගෙන්/තැනැත්තන්ගෙන් හානි පූර්ණය වෙනුවෙන් මුදල් අයකර ගැනීමක් නියෝග කළ විටක දී හෝ එසේ නොවූ විටක දී වුව ද විනය ක්‍රියාමාර්ග ගැනීම සිදුකල යුතු ය.)

(ආ) අදාල තැනැත්තාගෙන් හෝ තැනැත්තන්ගෙන් වටිනාකම ආපසු අයකරගැනීමක් කළ යුතු නම් ඒ පිළිබඳවත්, ඉහත සඳහන් නිලධාරීන් විසින් "කපාහැරීමක්" නිර්දේශ කොට ඇත්නම්, ඒ පිළිබඳවත්, අදාල පරිදි කොමිෂන් සභාවේ ගණකාධිකාරිවරයා/විශ්වවිද්‍යාලයක මූල්‍යාධිකාරීවරයා/ විශ්වවිද්‍යාල විද්‍යායතනයක භාණ්ඩාගාරිකවරයා/ උසස් අධ්‍යාපන මධ්‍යස්ථානයක වඩාත් ජ්‍යෙෂ්ඨතම මූල්‍ය නිලධරයා විමසීමෙන් අනතුරුව ක්‍රියාකල යුතු වේ. — මූල්‍ය නිලධාරීන්ගෙන් විමසීම

(ඇ) කොමිෂන් සභාවේ සභාපතිවරයා/උසස් අධ්‍යාපන ආයතනයක/විද්‍යායතනයක ප්‍රධාන විධායක නිලධාරියා විසින් දී ඇති වෙනත් විධානයන් ක්‍රියාත්මක කිරීම.

3. නැති වීම හෝ හානි වීම සිදුවී ඇත්තේ මධ්‍යස්ථානයක හෝ ආයතනයක නම්, ඒ පිළිබඳ ව මණ්ඩපයේ/ආයතනයේ පරිපාලන කාර්ය මණ්ඩලයේ වඩාත් ජ්‍යෙෂ්ඨතම නිලධාරයා විසින් තම මණ්ඩපය/ආයතන අනුබද්ධව/අනුයුක්තව තිබෙන විශ්වවිද්‍යාලයේ ලේඛකාධිකාරීවරයා වෙත ඒ බව වාර්තා කළ යුතු ය. එවිට අදාල ලේඛකාධිකාරීවරයා විසින්, මෙම පරිච්ඡේදයේ දක්වා ඇති පරිදි ක්‍රියා කරනු ලබන අතර, මෙහි ඉහත 2.4 උපජේදයෙහි සඳහන් පරිදි දී ඇති තීරණයට අනුව උපදෙස් දෙනු ඇත. මණ්ඩලවල සහ ආයතනවල නැති වීම්

4. **විශ්වවිද්‍යාල පද්ධතියේ දේපලවලට ශිෂ්‍යයන් විසින් හානි සිදුකිරීම**

4.1 විශ්වවිද්‍යාල පද්ධතියේ දේපලවලට ශිෂ්‍යයන් විසින් හානි සිදු කර ඇති බවට කරුණු වාර්තා වී ඇති විට, විධිමත් පරීක්ෂණයකින් පසු එම හානි කිරීම්වල අලාභය ඒ සඳහා වගකිව යුතු සිසුන්ගෙන් අයකර ගැනීම හෝ අදාල ශිෂ්‍ය සංගම් වෙත වෙන් කොට ඇති මුදල්වලින් අඩු කර ගැනීමට කටයුතු කළ යුතු ය. වගකිව යුතු තැනැත්තන්ගෙන් අයකර ගත යුතු ය

4.2 යම් ශිෂයෙකු/ශිෂ්‍ය කණ්ඩායමක් විසින් දේපලවලට හානි කිරීමට වගකිව යුතු අවස්ථාවන්හි දී, එසේ සිදුකරන ලද හානියේ වටිනාකම එම ශිෂ්‍යාගෙන් හෝ ශිෂ්‍ය කණ්ඩායමෙන් අය කර ගත යුතු වේ. හානි කිරීමේ අලාභය අයකර ගැනීම